# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/181/2025 (PSC)

පී.ඒ.එස්.දුලාරි විල්සන්,
**අභියාචක**
**එදිරිව**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.05.12**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක පුද්ගලිකවම පෙනී සිටි.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් මනේෂා නිශ්ශංක මිය.

## -නියෝගය-

දෙපාර්ශවයම විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දෙන ලදි. අභියාචක වන පී.ඒ.එස්.දුලාරි වින්සන් යන අය විසින්, 2025.01.21 වෙනි දින මෙම විනිශ්වය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඇය වෙත ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය තාවකාලිකව අත්හිටුවා. ඇයට වෙනත් පාසලකට ස්ථාන මාරුවක් ලබා දෙන ලෙසයි. කරුණු සළකා බැලීමේ දී පැහැදිලිවම පෙනී යන්නේ, අභියාචක වෙනුවෙන් ස්ථාන මාරුවක් ලබා දීමට තීරණය වී ඇත්තේ, ඇය කෑගල්ල/ආචාර්ය ඇන්.ඇම්.පෙරේරා ජාතික පාසලේ වසර 08 කාලයක් සේවය කිරීම හේතුවෙනි. ඒ අනුව අභියාචක මෙම ස්ථානයෙන් ස්ථානමාරු කර ඇත්තේ, දැනට පවත්නා රෙගුලාසි යටතේය.

කෙසේ වෙතත් ඇය එම ස්ථානමාරුව අවලංගු කරන ලෙස ඉල්ලා නොසිටී. අභියාචක දැනට සේවය කරන රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයට ස්ථානමාරු ලබා පැමිණ, එහි සේවය කරමින් සිටී. එම පාසලේ ශිෂ්‍යයන් ලෙස අභියාචකගේ ඥාති සහෝදර දරුවන් සහ ඇය පදිංචි ස්ථානය අවට දරුවන් විශාල පිරිසක්

ඉගෙනීමේ කටයුතු වල නියැලෙන බව ඇය පවසා සිටී. එම පාසලේ ඇය විසින් දරනු ලබන කම්කරු තනතුර හේතුවෙන්, එම අය සහ අභියාචකද, විශාල පිරිසකගේ උපහාස, අපහාස වලට ලක්වන බවට ඇය පවසා ඇත. එම හේතුව නිසා ඇය සේවයෙන් ඉවත් වන බවටද, එවකට ලේකම්තුමා වෙතද දන්වා සිටි බවට ඇය තවදුරටත් පවසා ඇත. අභියාචනා පෙත්සමේ ඇය වැඩිදුරටත් පවසා ඇත්තේ, ඇයගේ දෙමාපියන් රෝගාතුරව සිටීමත්, ඇයගේ විවාහය අහිමිවීමත් හේතු කොට ගෙන, ඇය මානසික පීඩාකාරී තත්ත්වයකට ද පත්ව ඇති බවයි.

ඉහත කී හේතූන් සළකා බැලීමේ දී පෙනී යන්නේ, එම හේතුන් නිසා අභියාචකට දැනට සේවය කරන මෙම පාසලෙහි සේවය පවත්වා ගෙන යාමට ඇයට අසීරු වී ඇති බවයි. එම තත්ත්වය වළකාලීම සඳහා අභියාචක වෙනත් පාසලකට ස්ථානමාරු කිරීමට ඇති හැකියාව සොයා බලන ලදි. එකී සොයා බැලීමෙන් අනතුරුව අභියාචක දන්වා සිටින්නේ; දෙහිඕවිට ජාතික පාසලේ විදුහල්පති විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ආයතන ශාඛාවේ අතිරේක ලේකම් වෙත 2025.04.23 වෙනි දිනැතිව යවන ලද ලිපිය මඟින් දෙහිඕවිට ජාතික පාසලේ සේවා සහායක පුරප්පාඩුවක් පවතින බවත්, එය කඩිනමින් සම්පූර්ණ කිරීම කළයුතු බවටත් දන්වා යවා ඇති බවයි. අභියාචකගේ ස්ථානමාරුව එම විද්‍යාලයට ලබා ගැනීම සඳහා, එම ලිපිය නිකුත් කරන ලද බව එහි සඳහන් වේ. දෙහිඕවිට ජාතික පාසලේ විදුහල්පති විසින් එම ලිපියට අත්සන් තබා ඇත. ඉහත කී නිර්දේශය සළකා බලා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එම ලිපිය ඉදිරිපත් කරමින් වැඩිදුරටත් තොරතුරු විමසා ඇත. එම ලිපියට පිළිතුරු ලෙස අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත එවන ලද 2025.11.06 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ, අභියාචක දන්වා සිටින පරිදි එම පාසලේ පුරප්පාඩුවක් ඇති බවයි.

එම පුරප්පාඩුව සඳහා අභියාචක ස්ථානමාරු කළහොත්, ඇය දැනට සේවය කරන පාසලේ කාර්යයන් පවත්වා ගෙන යාමට එය බාධාවක් වන්නේදැයි යන කරුණටද අවධානය යොමු කරන ලදි. ඒ සඳහා එම පාසලේ විදුහල්පතිගෙන් විමසා බැලීමට තීරණය කරන ලද අතර, එම තීරණය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචක සේවය කරන පාසලේ විදුහල්පතිගෙන් විමසීමක් කර ඇති අතර, එම ලිපියට පිළිතුරු වශයෙන් 2026.03.26 දින රාජසිංහ මධ්‍ය විද්‍යාලයේ විදුහල්පති විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත. එම ලිපියට පාසලේ විදුහල්පති විසින් අත්සන් තබා ඇත. එම ලිපියට අනුව අභියාචකගේ තනතුර වන කාර්ය සහායක තනතුරේ අනුමත කාර්ය මණ්ඩලයට නියමිත තනතුරු හතම දැනට

සම්පූර්ණ කර ඇති අතර, එම පාසලේ කිසිදු පුරප්පාඩුවක් පෙන්වා නැත. එම ලිපියේ 04 ඡේදයේ සඳහන් කර ඇත්තේ, දැනට සිටන කාර්ය මණ්ඩලයේ කෙනෙකු නිදහස් කරන්නේ නම්, පාසලේ සේවය කළ සේවා කාලය පදනම් කරගෙන, කටයුතු කරන ලෙසයි. එම කරුණ මතම පෙනී යන්නේ, අභියාචකට එම පාසලෙන් ස්ථානමාරුවක් ලබාදුනහොත්, එයින් පාසලේ කාර්යයන්ට අපහසුතාවයක් උද්ගත නොවන බවයි.

ඉහත කරුණු වලට අවධානය ලක් කිරීමෙන් අනතුරුව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ තීරණය වන්නේ, අභියාචක දැනට ස්ථානමාරු ලබා සේවය කරමින් සිටින රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ සිට දෙහිඕවිට ජාතික පාසලට ස්ථානමාරුවක් ලබාදීම සුදුසු වන බවයි. ඒ අනුව අභියාචකට දෙහිඕවිට ජාතික පාසලට ස්ථානමාරුවක් ලබාදීමට නියෝග කරමු.

එකී ස්ථානමාරුව 2026.06.01 දින සිට ක්‍රියාත්මක කරන ලෙසටද වැඩිදුරටත් නියෝග කරමු.

මෙම නියෝගය ක්‍රියාත්මක කර වාර්තා කරන ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නියෝග කරමු.

ඉහත කරුණු සළකා බලා අභියාචකගේ ඉල්ලීමට ඉඩදෙමු.

අභියාචනයට අවසර ලබා දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-